# බළන්ගොඩ නගර සභාව
## 2022-02-28 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.02.28**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී ජී.ඩී.ඒ.සේමපාල මිය

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ අතර, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

**01. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක වැඩසටහනක් සඳහා සහභාගී වූ අතර, එහි දී තමන් පුද්ගලයෙක් වශයෙන් නොව සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් කතා කළ බව ද නගර සභාවට ඔවුන්ගෙන් යම් උපකාරයක් ඉදිරියේ දී ලැබිය හැකි බව ද මෙම කෙටි කාලය තුළ සියලුම දෙනාට උදව් කරමින් කටයුතු කරන බව ද පවසමින් අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.25 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අයවැය කෙටුම්පතෙහි සහන මලු බෙදා දීම සඳහා රු. ලක්ෂ 06 ක් වෙන් කර ඇති අතර, එම මුදල සමස්තයටම ද යන්න විමසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අයවැයෙහි පුනරාවර්තන හා ප්‍රාග්ධන වශයෙන් කොටස් දෙකක් පවතින අතර, මිලියන 17 ක මුදල ප්‍රාග්ධන මුදල් වන බැවින් එයට බඩු මලු බෙදා දීම ඇතුලත් වී නැති බව ද අයවැය සඳහා තමන් මෙම යෝජනාව එක් කරන බව අනිකුත් මන්ත්‍රීවරුන් සඳහා පැවසූ බව ද සභා අනුමැතිය ගරු ආණ්ඩුකාරතුමාට යොමු කර, එතුමාගේ අනුමැතිය ලබා දුනහොත් මෙය ඉටු කරන බව ද ලක්ෂ 06 වෙන් කරන ලද්දේ තමන්ට බව ද පැවසීය.

අනතුරුව ගණකාධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.